## පූජ්‍ය කුඩාවැල්ලේ වංගීස හිමි අනුස්මරණ ත්‍යාගය

**01. ත්‍යාගයේ නම** - පූජ්‍ය කුඩාවැල්ලේ වංගීස නාහිමි අනුස්මරණ ත්‍යාගය

**02. දාතෘ** - ශ්‍රී කල්‍යාණිවංශික තපෝවන සංඝ සභාව

**03. නිමිත්ත** - කම්මට්ඨානාචාර්ය පූජ්‍ය කුඩාවැල්ලේ වංගීස අධිකරණ සංඝ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කොළඹ, මුල්ලේරියාව නව නගරය, කලපළුවාව ගෝතම තපෝවනය පිහිටි මාතික මාතා සමිතියේ ආදි කර්තෘන් වහන්සේ ය. එසේ ම එම මාතික මාතා සමිතිය විසින් තම අනුශාසකත්වය යටතේ ආරම්භ කරන ලද යථෝක්ත ගෝතම තපෝවනය ප්‍රධාන කොටැති අභය භූමි තපෝවනය, මිහින්තලේ  කළුදිය පොකුණ තපෝවනය, පදවි ජනපදයේ දෙවියන්ගේ කන්ද තපෝවනය සහ මහනුවර උඩවත්ත කැළේ ශ්‍රී දළදා තපෝවනය යන ආයතනයන්හි ආධිපත්‍යය ඉසුලූ හ. මෙම නාහිමිපාණෝ තපෝවනයේ භාවනා පුහුණුව සඳහා පැමිණි විදේශික පිංවතුන්ගේ ආරාධනා පරිදි තායිලන්තය, ඩෙන්මාර්කය හා ජර්මනය වැනි විදේශයන්ට වැඩම කොට විදර්ශනා භාවනාව ප්‍රධාන බුද්ධ ධර්මය ඉගැන්වූ හ. මීට අමතර ව, ස්වකීය සේවාවන් ඉදිරියට ගෙන යාම සඳහා විශාල පැවිදි ශිෂ්‍ය පිරිසක් ද පුහුණු කළහ. එම ශිෂ්‍යයන්වහන්සේ අතුරන් අයකු වූ, කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අංශයේ ආචාර්යවරයකු ලෙස සේවය කරන තපෝවනයේ සුතධර ස්වාමීන් වහන්සේගේ අදහසක් පරිදි ස්වකීය ගුරුදෙව්පියානාණන් වහන්සේට උපහාර දක්වනු වස් උන්වහන්සේගේ ද සෙසු සහෝදර ස්වාමීන් වහන්සේලාගේ ද උදෙෘාගයෙන් පිරි ආධාරය සහිත ව මෙම ත්‍යාගය කැලණිය විශ්වවිද්‍යාලයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටීමට තීරණය කරන ලදි.

**04. ත්‍යාගයේ ස්වභාවය** - මෙම ත්‍යාගය වර්ෂයකට වරක් ප්‍රදානය කරනු ලැබේ. උක්ත ශ්‍රී කල්‍යාණිවංශික තපෝවන සංඝ සභාව විසින් කැලණිය විද්‍යාලයට ප්‍රදානය කරනු ලබන රුපියල් දහ දහසක මුදල විශ්වවිද්‍යාලය මැනවැයි තීරණය කරන බැංකුවක ස්ථිර ව තැන්පත් කරනු ලැබේ. එහි වාර්ෂික පොලී මුදලින් මෙම ස්ථිර තැන්පතුව පාලනය කිරීම සඳහා මුදලක් වැය වේ නම් ඉතිරි වන මුදලින් අවම වශයෙන් රුපියල් දහසක් හෝ උපරිම වශයෙන් සියලු පොලී මුදල පහත සඳහන් කොන්දේසියට යටත් ව ත්‍යාගය ලබන්නාට පරිත්‍යාග කළ යුතු ය.

**05. කොන්දේසි** - ත්‍යාග මුදල නිතර ම රවුම් ගණනන් විය යුතු ය. (උදා: පොලිය රුපියල් 1228.50ක් නම් රුපියල් විසි අටයි ශත පනහ නැවත ස්ථිර තැන්පතුවට යොමු කළ යුතු ය.) තරගයේ පරිපාලන කටයුතු සඳහා වන වියදම් ප්‍රමාණය විශ්වවිද්‍යාලයේ මුල විධි විධානයන්ට අනුකූල ව විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.)

**06. ත්‍යාගයේ පාලක මණ්ඩලය** - කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨාධිපතිතුමා, වාග්විද්‍යා අංශප්‍රධානතුමා සහ ශ්‍රී කල්‍යාණිවංශික තපෝවන සංඝ සභාවේ නියෝජිත ස්වාමීන් වහන්සේ නමක් යන ත්‍රිපුද්ගල මණ්ඩලයක් පත් කළ යුතු ය. එය කැලණිය විශ්වවිද්‍යාලයේ පූජ්‍ය කුඩාවැල්ලේ වංගීස නාහිමි අනුස්මරණ ත්‍යාග භාරය නමින් හැඳින්වේ. එම මණ්ඩලය සඳහා අප සංඝ සභාවේ නියෝජිතවරයා ලෙස, කැලණිය විශ්වවිද්‍යාලයේ වාග්විද්‍යා අංශයේ කථිකාචාර්ය, අප සංඝ සභාවේ සම ලේකම් පූජ්‍ය තපෝවනයේ සුතධර හිමිපාණන් නම් කරමු. එහිමියන් එම තනතුර ස්වේච්ඡාවෙන්

දරනු ලබන තාක් එම ත්‍යාග භාරයේ අප සංඝ සභාව නියෝජනය කරන සාමාජිකයන් වහන්සේ වනු ඇත.

**07. ත්‍යාගලාභියා තීරණය කිරීමේ නිර්ණායක** - කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් සමත් ව වාග්විද්‍යා විෂයට වැඩි ම ලකුණු ලබාගන්නා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේට හෝ විද්‍යාර්ථියාට මෙම ත්‍යාගය ප්‍රදානය කළ යුතු ය.

ත්‍යාගලාභියාගේ ජාතිය, ආගම, ස්ත්‍රීපුරුෂභාවය, ගිහිපැවිදිභාවය එම ත්‍යාගය ලැබීමට කිසි දු බාධකයක් නොවේ.

1. මෙම ත්‍යාගලාභියා වෙනත් ත්‍යාග, ශිෂ්‍යත්ව හෝ ප්‍රදාන ලැබීමට ලබා සිටීම මෙම ත්‍යාගය ලබාගැනීමට නුසුදුසු කමක් නොවේ.

2. මෙම ත්‍යාගලාභියා විශේෂවේදී උපාධිය සඳහා වාග්විද්‍යාව තෝරා ගැනීම අනිවාර්ය නොවේ.

**08. ත්‍යාගය ප්‍රදානය කිරීමේ දිනය ස්ථානය** - යථෝක්ත විභාග ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරු ව එළඹෙන, වාග්විද්‍යා අංශයට අයත් වන පීඨයේ (දැනට මානවශාස්ත්‍ර පීඨයේ) රැස්වීමක දී මෙම ත්‍යාගය ප්‍රදානය කිරීම යෝග්‍ය ය. විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරනු ලබන වෙනත් විශේෂ සංවත්සර හෝ ත්‍යාගය ප්‍රදාන ආදි උත්සවයක් ඉහත කී විභාගයේ ප්‍රතිඵල නිකුත් අනතුරු ව එළඹේ නම් එහි දී ද මෙම ත්‍යාගය ප්‍රදානය කළ හැකි ය.

**09. ත්‍යාග ප්‍රදානය දැනුම්දීම** - ත්‍යාගලාභියාගේ නමත්, ත්‍යාග ප්‍රදානය කරනු ලබන දිනයත් සභාපති ස්වාමීන් වහන්සේ, ශ්‍රී කල්‍යාණිවංශික තපෝවන සංඝ සභාව, ගෞතම තපෝවනය, කලපළුවාව මුල්ලේරියාව නව නගරය යන ලිපිනයට දැනුම්දිය යුතු ය. එම ත්‍යාග ප්‍රදානය සඳහා යථෝක්ත සංඝ සභාවේ සභාපතීන් වහන්සේ හෝ උන් වහන්සේගේ නියෝජිතයකු හෝ සහභාගි වීමට කැමැත්තේ නම් ඊට අවස්ථාව සලසා දිය යුත්තේ ය.

**10. ත්‍යාගයේ ස්වභාවය සහ සංශෝධන කටයුතු** - මෙම ත්‍යාග මුදල තැන්පත් කෙරෙන බැංකුව විසින් ස්ථිර තැන්පතුවලට ගෙවනු ලබන පොලී මුදල වැඩි වීම නිසා හෝ ශ්‍රී කල්‍යාණිවංශික තපෝවන සංඝ සභාව විසින් ඉදිරියේ දී කරනු ලබන පරිත්‍යාග නිසා හෝ මෙම ත්‍යාග මුදල් ප්‍රමාණය වැඩි කළ හැකි ය. එබඳු අවස්ථාවක ශ්‍රී කල්‍යාණිවංශික තපෝවන සංඝ සභාව සහ වාග්විද්‍යා අංශයේ ආචාර්ය මණ්ඩලය ඇතුළත් විශ්වවිද්‍යාල නියෝජිත පිරිසක් අතර කරනු ලබන සාකච්ඡාවකින් පසු එම සංඝ සභාවේ තීරණය අනුව මේ ත්‍යාගය ශිෂ්‍යත්වයක් දක්වා වුව ද වර්ධනය කළ හැක්කේ ය. එසේ නමුදු කිසි ම සභාවකට මෙම ත්‍යාගය නැති කළ නොහැක්කේ ය.

**11. මෙම ත්‍යාගය ප්‍රදානය කරනු ලබන ප්‍රථම අවස්ථාව** - ව්‍යවහාර වර්ෂ 1996 දී පවත්වනු ලබන ප්‍රථම වර්ෂ පරීක්ෂණයෙන් සමත් ව යථෝක්ත සුදුසුකම් සපුරන විද්‍යාර්ථියාහට මුල් වරට මේ ත්‍යාගය ප්‍රදානය කළ යුත්තේ ය.